**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.10.13 වන දින පැවැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 ඔක්තෝම්බර් මස 13 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්ෂ්මිණී දසනායක මැතිතුමිය. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.09.08)**

2022.09.08 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සභා වාර්තාවේ **"පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම"** යන තීරුව යටතේ පසුගිය සභාවේ ප්‍රගිතිය මෙම සභාවේ දී ඉදිරිපත් කිරීමට ඇති බවත් , නමුත් ප්‍රගිතිය සාකච්ඡා නොවන බවත් , එනිසා එම තීරුව සභා වාර්තාවෙන් ඉවත් කිරීම සුදුසු බවත් ය.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙය සභාවන් පැවැත්වීම පිළිබඳව ඇති ආකෘතියකට අනුව සකස් කර ඇති බවත් , සෑම සභාවක් ම මෙම ආකෘතියට අනුව සිදු වන බවත් , එය කිසිවෙකුට ඉවත් කළ නොහැකි බවත් , සෑම සභාවාරයකදී ම සිදු වන්නේ යම් කිසි ප්‍රගතියක් පිළිබඳව සාකච්ඡා කිරීම බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටියේ මෙම තීරුව යටතේ කතා නොකළ ද සභාව තුල ප්‍රගිතිය සාකච්ඡා වීමක් සිදු වන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ න්‍යාය පත්‍රයේ ඇති එම තීරුව යටතේ අවශ්‍ය ගරු මන්ත්‍රීවරයෙකුට කුමන හෝ තීරණයක් සම්බන්ධයෙන් ප්‍රගතිය විමසිය හැකි බවත් , එසේ ප්‍රගතිය විමසූ අවස්ථාවක දී එය වැළැක්වූවානම් එය වැරදි බවත් , නමුත් කිසිම සභාවක එසේ නොවුන බවත් , මෙම තීරුව එසේ අපට අවශ්‍ය ආකාරයෙන් ඉවත් කළ නොහැකි බවත් ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු විපක්ෂනායකතුමාගේ අදහස නිවැරදි බවත් , එම තීරුව එසේ ඉවත් කළ නොහැකි බවත් , එය සභා වාර්තා ආකෘතියේ සඳහන් වන බවත් , මහා සභාවකදී සෑම අවස්ථාවකම සිදු වන්නේ මීට පෙර සිදු කළ හා සිදු කිරීමට බලාපොරොත්තු වන සෑම දෙයකම ප්‍රගිතිය සාකච්ඡා වීමක් බවත් , ආදාල අවස්ථා වල දී මෙම තීරුව යටතේ ප්‍රගිතිය ඉදිරිපත් කළ අවස්ථා ඇති බවත් , සභා තීරණ අදාල විෂයන් වලට ලබා දී ඊළඟ සභාව පැවැත්වීමට සතියකට පෙර ඒවායෙහි ප්‍රගිතිය ලබා ගන්නා බවත් , ඒවායෙහි විශේෂ සිද්ධියක් සිදු වුනා නම් අනිවාර්යෙන් ම සභාව දැනුවත් කරන බවත් , ගරු මන්ත්‍රීතුමන්ලා විසින් විමසන ඕනෑම තීරණයක ප්‍රගිතිය ලබා දීමට තමා සූදානම් බවත් , ප්‍රගිතිය පිළිබඳව සාකච්ඡා කළ අවස්ථා වල දී එම ප්‍රගිතියන් සභා වාර්තා වල සටහන් කර ඇති බවත් ය.

ඒ අනුව 2022.09.08 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිනිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය. - නැත.**

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

1.2022.08.18 දින මහා සභාවේ තීරණ අංක 02ට යටත්ව පැල්මඩුල්ල , කුට්ටපිටිය , වත්තෙ පංගුව පදිංචි යකුපිටි සමන් ප්‍රියදර්ශන මහතා විසින් එවා ඇති කිරිඳි ඇල්ල සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලැස්ම සභාවට ඉදිරිපත් කිරීම.

2.ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් අනුමත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කරන ලද පැල්මඩුල්ල රිල්හේනවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියෙහි අවිච්ඡේද වැඩ නිම කිරීම සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශය වෙත පවරා ගන්නා බවත් , එබැවින් අවිච්ඡේද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන ලෙසත් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම්ගේ අංක PLD3/PLD/DV5/SPORT/2021 හා 2022.06.09 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.මෙම ව්‍යාපෘතියෙහි ඉටු කරන ලද වැඩ ප්‍රමාණය අනුව ප්‍රතිපූර්ණය සඳහා යවන ලද බිල්පත් වටිනාකම රු.895,659.80 ක් (කාර්මික නිලධාරී නිර්දේශය අනුව) හා ප්‍රතිපූර්ණය වූ මුදල රු.834,113.30 කි.අවිච්ඡේද ප්‍රතිපාදන මුදල රු.503,678.00ක් වන අතර කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදල රු.750,701.97 කි.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

I. **<u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

01.2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සේවාවන් හා පහසුකම් ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| සපයන සේවාව හෝ පහසුකම | පැවති ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු | රු. 500.00 | රු.1000.00 |
| විථී රේඛා සහ ගොඩනැගිලි සීමා ගාස්තු | රු.1000.00 | රු.1500.00 |
| වරිපනම් ගෙවන බවට සහතික නිකුත් කිරීම | රු. 500.00 | රු.1000.00 |
| විදුලිය ලබා ගැනීම සඳහා සහතික නිකුත් කිරීම | රු. 250.00 | රු. 500.00 |
| ලේඛන වල පිටපත් නිකුත් කිරීම | රු. 100.00 | රු. 150.00 |
| වසර දෙකකට වඩා පැරණි ලේඛන සෙවීමට වර්ෂයකට | රු. 50.00 | රු. 100.00 |
| වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම | රු. 100.00 | රු. 150.00 |
| අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරම ගාස්තු | රු. 450.00 | රු. 750.00 |
| ජල බවුසරය ලබා දීම (ලී.5000) දිනකට | රු.5000.00 | රු.7500.00 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු | රු.1500.00 | රු.5000.00 |
| සභාව සතු භූමිය කුලියට දීම - එක් දිනකට | රු.5000.00 | රු.7500.00 |
| ඉඩම් වෙන්දේසි, ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ලබා දීම | රු. 500.00 | - |
| ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයදුම්පත් ගාස්තු | රු. 25.00 | - |
| දැන්වීම්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය සඳහා අයදුම්පත්‍ර ගාස්තු | රු. 25.0 | - |
| ජලය ලබා ගැනීමට මාර්ගය පළුදු කිරීම් පරික්ෂා කිරීම සඳහා සේවා ගාස්තු | රු. 300.00 | රු. 500.00 |
| ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම. | රු. 250.00 | රු. 500.00 |
| ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නා.සං.අධිකාරියට අයත් වන) | රු. 750.00 | රු.1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු රු.1500.00 සිට රු.5000.00 දක්වා වැඩි කර ඇති බව ය.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා කම්පැනි මඟින් ඉල්ලීම් කරන බවත් , වත්මනෙහි පවතින මුදලත් සමඟ මෙය ගැටළුවක් නොවන බවත් , මෙය ඔවුන්ගේ පුද්ගලික වියදමක් නොවන බවත් ආයතනය මඟින් කරන ගෙවීමක් බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරම ගාස්තු වැඩි කර ඇති බවත් , ගහේ වටිනාකමක් ඇති නම් එය ගැටළුවක් නොවන බවත් , නැතිනම් එම ගස ඉවත් කිරීමට කිසිවෙක් ඉදිරිපත් නොවන බවත් ය.අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ එමඟින් ගස් කපන එක හෝ අඩු වන බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු රු.500.00 සිට රු.1,500.00 දක්වා සංශෝධනය කර ඇති බවත් , සභාවට වරිපනම් මුදල් ගෙවන අය නිසා එය රු.1000.00 ලෙස සංශෝධනය වීම සුදුසු බවත් ය.එය සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 01</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන ඉහත සේවාවන් හා පහසුකම් සඳහා 2023 වර්ෂයේ සිට සංශෝධිත ගාස්තුව අය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02. සතිපොළ භූමිය සහ සතිපොළ අසල රථගාල කුලියට දීමේ දී වැය වන විදුලි හා ජල ගාස්තුව ඉහළ යාම හේතුවෙන් අය කරන ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| කාරණය | පවතින ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| සතිපොළ භූමිය කුලියට දීම. | රු.5,000.00 | රු.7,500.00 |
| සතිපොළ අසල රථ ගාල කුලියට දීම. | රු.5,000.00 | රු.7,500.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 02**

සතිපොළ භූමිය සහ සතිපොළ අසල රථගාල කුලියට දීමේ දී වැය වන විදුලි හා ජල ගාස්තුව ඉහළ යාම හේතුවෙන් 2023 වර්ෂයේ සිට ඉහත පරිදි සංශෝධිත ගාස්තුව අය කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**03.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන තාවකාලික වෙළඳ ව්‍යාපාර පවත්වා ගෙන යන ව්‍යාපාරිකයින්ගෙන් දෛනිකව ගාස්තුවක් පහත පරිදි අය කර දෛනික අවසර පත්‍රයක් ලබා දීම සුදුසු බවටත් , ප්‍රාදේශීය සභාව මඟින් දැනුම් දෙනු ලබන ඕනෑම අවස්ථාවක තාවකාලික වෙළඳ ව්‍යාපාර අදාළ ස්ථාන වලින් ඉවත් කර ගැනීමට ව්‍යාපාර හිමියන් කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| | ගාස්තුව |
|---|---|
| • මුහුණත දිග අඩි 5ට අඩු | රු. 50.00 |
| • මුහුණත දිග අඩඅ 5ත් 10ත් අතර | රු.100.00 |
| • මුහුණත දිග අඩි 10ට වැඩි | රු.150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

දිනකට මුදලක් අය කිරීම පිළිබඳවත් , මේ සඳහා යම්කිසි නිශ්චිත ස්ථානයක් තිබෙනවාද යන්නත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විමසන ලදී.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පැල්මඩුල්ල ටෙලිකොම් ආයතනය අසල නගර සීමාවේ ඇති තාවකාලික වෙළෙඳසැල් වලින් දෛනිකව ගාස්තුවක් අය කිරීම සුදුසු බවත් , සමහර වෙළෙඳුන් එක් දිනක් පැල්මඩුල්ලෙහි වෙළෙඳාම් සිදු කර ඊළඟ දිනයේ වෙනත් ප්‍රදේශයක වෙළෙඳාම් සිදු කරන බැවින් දෛනිකව ගාස්තුවක් අය කිරීම සුදුසු බවට යෝජනා කළ බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ ස්ථිර වෙළෙඳසැල් මඟින් කඩ කුලී , විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවමින් පවත්වා ගෙන යන බවත් , ව්‍යාපාරිකයන්ගේ බදු මුදල් වලින් ප්‍රාදේශීය සභාව පවත්වා ගෙන යන බවත් , මෙමඟින් එම වෙළෙන්දන්ට අසාධාරණයක් වන බවත් , එම කඩහිමියන් රැක ගත යුතු බවත් , එනිසා සීමාවක් නම් කිරීම සුදුසු බවත් ය.

එසේ නම් තීරණය ලබා ගැනීමේ දී නගරාශ්‍රිතව ලෙස සඳහන් වීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසාන ලදී. අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා පවසා සිටියේ මෙහි දී ව්‍යාපාරයේ ස්වභාවය සලකා බැලීම සුදුසු බවත් , දීර්ඝ කාලීනව වෙළෙඳාම් නොකරන අය ලෙස තීරණය ලබා ගැනීම සුදුසු බවත් ය.එසේ තීරණය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ද පවසන ලදී.

**තීරණ අංක 03**

2023 වර්ෂයේ සිට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නගරාශ්‍රිතව සිදු කරනු ලබන දීර්ඝ කාලීනව වෙළෙඳාම් නොකරන එනම් දෛනිකව තාවකාලික වෙළඳ ව්‍යාපාර පවත්වා ගෙන යන ව්‍යාපාරිකයින්ගෙන් දෛනිකව ගාස්තුවක් ඉහත පරිදි අය කර දෛනික අවසර පත්‍රයක් ලබා දීම සුදුසු බවටත් , ප්‍රාදේශීය සභාව මඟින් දැනුම් දෙනු ලබන ඕනෑම අවස්ථාවක තාවකාලික වෙළඳ ව්‍යාපාර අදාළ ස්ථාන වලින් ඉවත් කර ගැනීමට ව්‍යාපාර හිමියන් කටයුතු කළ යුතු බවටත් ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්ති ප්‍රකාරව දැන්වීම් පුවරු අය කරන ගාස්තුව පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| කාරණය | පවතින ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| බිත්තියක හා පුවරුවක සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම වර්ග අඩි 01 කට වර්ෂයක් සඳහා | රු. 75.00 | රු.150.00 |
| ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි 01කට වර්ෂයක් සඳහා | රු.125.00 | රු.300.00 |
| බැනරයක් හෝ කටවුට් මඟින් ප්‍රදර්ශනය කිරීම. –<br>✓ මාසයක කාලයක් සඳහා වර්ග අඩි 01කට<br>✓ මාස 03 කාලයක් සඳහා වර්ග අඩි 01කට<br>✓ මාස 03කට වැඩි කාලයක් සඳහා වර්ග අඩි 01කට | රු. 30.00<br>රු. 40.00<br>රු. 50.00 | රු. 75.00<br>රු.100.00<br>රු.150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 04**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්ති ප්‍රකාරව 2023 වර්ෂයේ සිට දැන්වීම් පුවරු සඳහා අය කරන ගාස්තුව ඉහත පරිදි සංශෝධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**05.**2023 වර්ෂය සඳහා ආදායම් පැනවීම සම්බන්ධ යෝජනා සභාවට ඉදිරිපත් කිරීම.

i. **2023 වර්ෂයට වරිපනම් බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශ පිහිටි සියළුම නිවාසවල ,ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2022 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, ඒකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සීයයට හයක (6%) වරිපනමක් ද,

**02.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාරපන උප කාර්යාල ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට හතරක් (4%) වරිපනමක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31 - ජූනි 30 - සැප්තැම්බර් 30 - දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - i</u>**
2023 වර්ෂයට වරිපනම් බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ii. 2023 වර්ෂයට අක්කර බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධාන යටතේ පළාත් පලාන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.02.03 වන දිනැති ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද , ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ)හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම හෙක්ටයාරය මත , 2023 වර්ෂය සඳහා රු. 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ආ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2023 වර්ෂය සඳහා රු.10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (06) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31 , ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යයි ද යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - ii</u>**
2023 වර්ෂයට අක්කර බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**iii. 2023 වර්ෂයට කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උප ලේඛනය**

| I වන තීරුව | | IIවන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්ත බදු | පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | ස්වර්ණාභරණ නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | වාස්තු කර්මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 03 | විසිතුරු භාණ්ඩ නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කුළු බඩු / කසායබඩු / බෙහෙත් ද්‍රව්‍ය පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | පිංතූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | මැටි භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 07 | කෘතිම මල් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 08 | රූපවාහිනී ඇන්ටනා නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ධාන්‍ය ඇට පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ලියුම් කවර හෝවෙනත් කවර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12 | මෙට්ට නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 13 | හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 14 | බැග්වර්ග මැසීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ඔරලෝසු අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 16 | පිත්තල භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ඇඳුම් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ස්ටිකර් කැපීම / දැන්වීම් / නාමපුවරු සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | යතුරු කැපීම / සීල් කැපීම | 500.00 | 750.00 | 1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05 - iii**
2023 වර්ෂයට කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iv. 2023 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| **I වන තීරුව** | **II වන තීරුව** |
|---|---|
| බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු. ශත |
| 1. රු. **6,000** නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. රු. **6,000** ඉක්මවන නමුත් **12,000** නොඉක්මවනවිට | **90.00** |
| 3. රු. **12,000** ඉක්මවනනමුත් **18,750** නොඉක්මවනවිට | **180.00** |
| 4. රු. **18,750** ඉක්මවනනමුත් **75,000** නොඉක්මවනවිට | **360.00** |
| 5. රු. **75,000** ඉක්මවනනමුත් **150,000** නොඉක්මවනවිට | **1,200.00** |
| 6. රු. **150,000** ඉක්මවනවිට | **3,000.00** |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05- iv**
2023 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**v. කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යස්ථාව යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව.**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යස්ථාවක් යටතේ හෝ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යස්ථාවක් යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ ii වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරිමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2022 වර්ෂයේ ලැබිම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් සභාව යෝජනා කරන්නීය.

**අංක 01 උප ලේඛනය - අන්තරාදායක ව්‍යාපාර**

| **I වන තීරුව** | | **II වන තීරුව** | | |
|---|---|---|---|---|
| | | **ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්** | | |
| **අනු අංකය** | **කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය** | **750 නොඉක්මවන අවස්ථාවක** | **750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක** | **1500 ඉක්මවන අවස්ථාවක** |
| 01 | වඩු කර්මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 02 | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | ගඩොල් හෝ උළු නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | පාවහන් අළුත් වැඩියාව හා නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බ්ලොක් ගල් නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | ඉන්ධන පිරවුම්හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | ග්‍රිල් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | සිමෙන්ති භාණ්ඩ නිපදවීම /විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | පත්තර රැස්කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 10 | මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | තේ කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ගල් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | ගල් මෝලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**අංක 02 උප ලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර**

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
| | | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | සත්ව ආහාර අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 02 | ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | කෘතිම පොහොර අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 04 | පැණි,හකුරු නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | අයිස්ක්‍රීම් / අයිස්පැකට් / යෝගට් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | රබර් මිලට ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | කුල්ස්පොට් එකක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | නූඩ්ලස් /ඉදිආප්ප / ක්ෂණික ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | මෝටර් සයිකල් අළුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ශීත කල මස් මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | එළවළු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | පළතුරු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | සත්ව ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | සංචාරක වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | මස් පිණිස සත්ව ඝාතන මඩුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | භෝජනාගාරයක් / බත්කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | ආපන ශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | එළකිරි එකතු කිරීමේ හෝ වෙළඳාම් ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | කේක් වර්ග අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 26 | කිරි පට්ටියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | ගව ගාලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | සත්ව ගොවිපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**අංක 03 උප ලේඛනය - අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර**

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂිකව ටිනාකම රුපියල් | | |
| | | 750 නොඉක්මවන අවස්ථාවක | 750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක | 1500 ඉක්මවන අවස්ථාවක |
| 01 | වෑල්ඩින් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | හුණු පිලිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | ගොඩනැඟිලි ද්‍රව්‍ය විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | මැණික් කැපීම හා ඔප දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 06 | ගල් ස්මාරක හෝ ගලින් කරන ලද භාණ්ඩ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 07 | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | හුණු පෝරණුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | ලෝහ තහඩුවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 10 | විදුලි උපකරණ අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 11 | ලියවන පට්ටල් වැඩපලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | පැරණි යකඩ බඩු මිලට ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | බැටරි චාර්ජ් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | ග්‍රොසරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | රසකැවිලි නිපදවීම / අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ඉංග්‍රීසි බෙහෙත් ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ආයුර්වේද බෙහෙත් ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 18 | මෝටර් රථ අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ත්‍රිරෝද රථ අළුත් වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 20 | රබර් කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 21 | අයිස්ක්‍රීම් / අයිස්පැකට් / යෝගට් නිෂ්පාදන ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 22 | සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වා ගෙන යාම | | | |
| 23 | නවාතැන් ගන්නා ස්ථානයක් / තානායමක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | හෝටලයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | බේකරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | බාබර් සාප්පුවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | වාහන සේවා ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | ලොන්ඩරියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | වී මෝලක් / ඇඹරුම්හලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | ලුහු කර්මාන්තය (කම්මල් කර්මාන්තය) | 500.00 | 750.00 | 1000.00 |
| 31 | වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 05 – v</u>
කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**vi. 2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ 4 වන උප ලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයේ දී පහත උපලේඛනයේ i වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි ii වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

**රු. ශත**

- මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුවකට 25.00

- සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරයක් හෝ කරත්තයක් සඳහා :-

  (අ)වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් 18.00

  (ආ)වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් 4.00

- සෑම කරත්තයක් සඳහා 10.00
- සෑම අත්කරත්තයක් සඳහා 10.00
- සෑම රික්ෂෝවක් සඳහා 7.50
- සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා 15.00
- සෑම ඇතකු සඳහා 50.00

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ " වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 05 - vi</u>
2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**vii. 2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරිමේ යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශීය බල සීමාව තුල කිනම් ආකාරයට හෝ පෙනෙන පරිදි ප්‍රදර්ශනය කිරිමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2023 ජනවාරි මස 01 දින සිට අයකල යුතු යැයි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

**උප ලේඛනය**

රු.ශත

01. බිත්තියක හා පුවරුවක සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් සඳහා සෑම ව.අ. 01 කට - වර්ෂයකට රු. 150.00

02. ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා ව.අ. එකකට රු.300.00

03.බැනරයක් හෝ කටවුට් මඟින් ප්‍රදර්ශනය කිරිම
 මාසයක කාලයක් සඳහා ව.අ. 01 කට රු. 75.00
 මාස 03 ක කාලයක් සඳහා ව.අ. 01 කට රු. 100.00
 මාස 03 කට වැඩි කාලයක් සඳහා ව.අ. 01 කට රු. 150.00

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - vii</u>**
2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**viii .2023 වර්ෂය සඳහා සතිපොළ බදු අයකිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 119 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සතිපොළෙහි 2022 වර්ෂය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි බදු අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | උපලේඛනය | රු. ශත |
|---|---|---|
| 01. | සතිපොළ ගොඩනැගිල්ල ඇතුළත ස්ථිර කඩ කාමරයක් සඳහා | 250.00 |
| 02. | සතිපොළ භූමිය තුළ තාවකාලිකවෙළඳ ස්ථානයක් සඳහා | 200.00 |
| 03. | මාර්ගය දෙපස තාවකාලික වෙළඳ ස්ථාන සඳහා | 180.00 |
| 04. | වෙනත් සුළු වෙළඳුන් සඳහා (ජංගම වෑන් රථයක්/ත්‍රීරෝද රථයක් වැනි) | 150.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - viii</u>**
2023 වර්ෂය සඳහා සතිපොළ බදු අයකිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ix. 2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරනප්‍රාදේශීයසභාපනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන“සමානුපාතය” වශයෙන් අදාළ ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:7 ක් වන සේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 ක් වන බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 – ix</u>**
**2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**x. 2023 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා ආකෘතිපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන යම් යම් සේවාවන් හෝ පහසුකම් වෙනුවෙන් ඒ සඳහා විශේෂ වූ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා වෙනුවෙන් පහත පරිදි අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| 1. | වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු | 1000.00 |
| 2. | විථි රේඛා සහ ගොඩනැගිලි සීමා ගාස්තු | 1500.00 |
| 3. | වරිපනම් ගෙවන බවට සහතික නිකුත් කිරීම | 1000.00 |
| 4. | විදුලිය ලබා ගැනීම සඳහා සහතික නිකුත් කිරීම | 500.00 |
| 5. | ලේඛන වල පිටපත් නිකුත් කිරීම | 150.00 |
| 6. | වසර දෙකකට වඩා පැරණි ලේඛන සෙවීමට වර්ෂයකට | 100.00 |
| 7. | වරිපනම් නොගෙවන බවට සහතික නිකුත් කිරීම | 150.00 |
| 8. | අනතුරු දායක ගස් ඉවත් කිරීමේ පෝරම ගාස්තු | 750.00 |
| 9. | ජල බවුසරය ලබා දීම (ලී.5000) දිනකට | 7500.00 |
| 10. | අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ගාස්තු | 5000.00 |
| 11. | සභාව සතු භූමිය කුලියට දීම - එක් දිනකට | 7500.00 |
| 12. | ඉඩම් වෙන්දේසි, ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ලබා දීම | 500.00 |
| 13. | ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයදුම්පත් ගාස්තු | 25.00 |
| 14. | දැන්වීම්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය සඳහා අයදුම්පත්‍ර ගාස්තු | 25.00 |
| 15. | ජලය ලබා ගැනීමට මාර්ගය පළුදු කිරීම් පරීක්ෂා කිරීම සඳහා සේවා ගාස්තු | 300.00 |
| 16. | ගලි බවුසරය ලබා දීම (ලෝඩ් 1 ක් වෙනුවෙන්) ආයතනයක් සඳහා | 2500.00 |
| | නිවසක් සඳහා | 2000.00 |
| | අයදුම්පත් ගාස්තු | 25.00 |
| | අවසාන බැහැරලීම සඳහා | 1000.00 |
| | සේවක ගාස්තු | 1500.00 |
| | ප්‍රවාහන ගාස්තුව 1 km ක් සඳහා රු. 200.00 බැගින් | |

මීට අමතරව ඉල්ලුම්කරු හට බැහැරලීම සඳහා ස්ථානයක් තිබෙනම් අවසාන බැහැරලීම සඳහා අය කරනු ලබන රු. 1000/ක ගාස්තුවෙන් නිදහස් කරයි.

| | | | |
|---|---|---|---|
| 17. | ආදාහනාගාර සේවා ගාස්තු - | බල ප්‍රදේශය තුළ | 12000.00 |
| | | බල ප්‍රදේශයෙන් පිට | 15000.00 |
| 18. | ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම | | 500.00 |
| | ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම (නා.සං.අධිකාරියට අයත්වන) | | 1000.00 |

19. ඉඩම් අනුබෙදුම් සඳහා ඉඩමේ ප්‍රමාණය(ව.මී) පෙරසැරි ගාස්තු

| | | |
|---|---|---|
| ව.මී.150- ව.මී.300 | කැබලි 1ක් සඳහා | රු 1000.00 |
| ව.මී 301 - ව.මී600 | කැබලි 1ක් සඳහා | රු 800.00 |

| | | |
|---|---|---|
| ව.මී.601 - ව.මී 900 | කැබලි 1ක් සඳහා | රු 600.00 |
| ව.මී 900ට වැඩි | කැබලි 1ක් සඳහා | රු 500.00 |

නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි

| ගෙබිම් ප්‍රමාණය | නේවාසික (වර්ග මීටර් 1කට) තනි පුද්ගල | ව.මීටර් 1කට මහල් නිවාස | නේවාසික නොවන (ව.මීටර් 1කට) |
|---|---|---|---|
| ව.මී 400දක්වා | රු 20.00 | රු 25.00 | රු 25.00 |
| ව.මී 401-1000 | රු 22.00 | රු 27.00 | රු27.00 |
| ව.මී 1001- 1500 | රු25.00 | රු30.00 | රු30.00 |
| ව.මී 1501-2000 | රු 25.00 | රු 32.00 | රු 32.00 |
| ව.මී 2000 ට වැඩි | වැඩිවන සෑම ව.මී 90ක් සඳහාම රු2000.00 බැගින් | වැඩිවන සෑම ව.මී 90ක් සඳහාම රු 2000/- බැගින් | වැඩිවන සෑම ව.මී 90 ක් සඳහාම රු 2000/- බැගින් |

**20.** පැල්මඩුල්ල සති පොළ අසල රථ ගාලේ සෑම බස් රථයක් සඳහාම මාසිකව රු. 500.00

| | | |
|---|---|---|
| **21.** පුස්තකාල අයදුම් පත් ගාස්තු | | රු. 5.00 |
| පුස්තකාල සාමාජික ගාස්තු | පාසල් ළමුන් සඳහා | රු. 50.00 |
| සාමාජිකත්වය අළුත් කිරීම | පාසල් ළමුන් සඳහා | රු. 15.00 |
| පුස්තකාල සාමාජික ගාස්තු | වැඩිහිටියන් සඳහා | රු. 100.00 |
| සාමාජිකත්වය අළුත් කිරීම | වැඩිහිටියන් සඳහා | රු. 30.00 |
| පුස්තකාල දඩ මුදල් දිනකට | | රු. 2.00 |

**22.** පරිසර ස්ථාන පරීක්ෂණ ගාස්තු අය කිරීම මධ්‍යම පරිසර අධිකාරී පනත අනුව නියමිත ගාස්තු අය කරනු ලැබේ.

**23.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා වන ගාස්තු අය කිරීමේදී 2021.07.08 වන දිනැති අංක 2235/54 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ගාස්තු උපලේඛනයන්ට අනුකූලව සිදු කෙරේ.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - x</u>**

2023 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් හා ආකෘතිපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**xi .2023 වර්ෂයට අදාලව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශය තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රෙද්ශයෙන් බාහිර ප්‍රෙද්ශ තුළ භෞතික සැලසුම් කාර්යයන් සඳහා වන ගාස්තු අය කිරීමේදී 2021.07.08 වන දිනැති අංක 2235/54 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ගාස්තු උපලේඛනයන්ට අනුකූලව එම ගාස්තු ප්‍රමාණයන්ගෙන් 50% ක ප්‍රතිශතයක් ගාස්තුව වශයෙන් අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - xi</u>**

2023 වර්ෂයට අදාලව භෞතික සැලසුම් කාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශ වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**xii .2023 වර්ෂය සඳහා සතිපොළ අසල රථගාල වෙනුවෙන් ගාස්තු අය කිරීමේ යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පැල්මඩුල්ල ප්‍රාෙද්ශිය සභාව විසින් සාදා සම්මත කර ගත් අංක 1865 හා 2014 මැයි මස 30 වන දින රජයේ ගැසට් පත්‍රෙය් පළ කරන ලද වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහන වලින් ගාස්තු අය කිරීම පිලිබඳ අතුරු ව්‍යවස්ථාවේ 06වන වගන්තිය අනුව පහත සඳහන් ආකාරයට ගාස්තු සංශෝධනය කර 2023 ජනවාරි මස 01 වන දින සිට අය කළ යුතු යයි පැල්මඩුල්ල ප්‍රාෙද්ශිය සභාව යෝජනා කරන්නීය..

උපලේඛනය

1. පාසල් බස් රථයක් සඳහා - මාසිකව රු 750.00
2. පාසල් වෑන් රථයක් සඳහා මාසිකව රු 500.00

| | පැයකට රු.ශත | පළමු පැයට වැඩි සෑම පැයක් සඳහාම රු. ශත |
|---|---|---|
| මෝටර් සයිකල් | 10.00 | 10.00 |
| ත්‍රීවීල් රථ | 20.00 | 10.00 |
| කාර්/වෑන් | 30.00 | 10.00 |
| බස් රථ/ ලොරිරථ | 50.00 | 10.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05 - xii</u>**
2023 වර්ෂය සඳහා සතිපොළ අසල රථගාල වෙනුවෙන් ගාස්තු අය කිරීම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** අප ආයතනයේ 2008 වර්ෂයට ආදාලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.26,026.00 ක හිඟ වැට් බද්දක් පවතින බවත් , හිඟ බදු සඳහා දඩයක් පනවා ඇති බවත් , මෙම හිඟ බදු මුදල ගෙවූ පසු එම දඩ මුදල ඉවත් කර ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දන්වා එවා ඇත.මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2008 වර්ෂයට ආදාලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.26,026.00 ක හිඟ වැට් බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමටත් , ඉන්පසුව හිඟ බදු සඳහා පනවා ඇති දඩ මුදල ඉවත් කර ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමටත් ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** රු.12.00 , රු.15.00 , රු.45.00 මුද්දර වල වටිනාකම පිළිවෙලින් රු.30.00 , රු.50.00 , රු.110.00 ලෙස වර්තමානයේ ඉහළ ගොස් ඇති බැවින් අප සභාවට ලිපි තැපැල් කිරීම සඳහා මීට පෙර ලබා ගත් රු.30,000.00 ක මුද්දර ප්‍රමාණය ප්‍රමාණයත් නොවීම හේතුවෙන් රු.50,000.00 ක වටිනාකමට මුද්දර ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07</u>**

මුද්දර වල වටිනාකම වර්තමානයේ ඉහළ ගොස් ඇති බැවින් ලිපි තැපැල් කිරීම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව මීට පෙර ලබා ගත් රු.30,000.00 ක මුද්දර ප්‍රමාණය ප්‍රමාණයත් නොවීම හේතුවෙන් රු.50,000.00 ක වටිනාකමට මුද්දර ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිදාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ දේපල තක්සේරු කිරීමේ කාර්ය නිමකර ගැනීමට හැකියාවක් පවතින බවත් , ඔවුන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම සඳහා එක් ඒකකයකට රු.60.00 මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවමින් පැල්මඩුල්ල බල ප්‍රදේශයේ තක්සේරු කාර්ය කර ගැනීමට එකඟ ද යන්න පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් විමසීම් කළ අතර ඊට එකඟ බව දන්වා කඩිනමින් ම ලිපියක් යොමු කළ අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 08</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිදාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ දේපල තක්සේරු කිරීමේ කාර්ය නිමකර ගැනීමට හැකියාවක් පවතින බව හා ඔවුන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම සඳහා එක් ඒකකයකට රු.60.00 මුදලක් තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවමින් පැල්මඩුල්ල බල ප්‍රදේශයේ තක්සේරු කාර්ය කර ගැනීමට එකඟ ද යන්න පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් කළ විමසීමට එකඟ බව දන්වා යැවීම සම්බන්ධයෙන් සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**09.** පැල්මඩුල්ල පොදු වෙළෙඳපොළ කඩ කාමර බදු දීම සම්බන්ධ ගිවිසුම් ප.පා.කො.1998/03 දරණ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොමැති අතර 2023 වර්ෂය සඳහා නව ගිවිසුම සකස් කිරීමේ දී 1998/03 චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කිරීමටත් , පැල්මඩුල්ල පොදු වෙළෙඳපොළ අංක 14 දරණ මාළු කඩය සඳහා පෙර වර්ෂ වල භාවිතා කළ පරිදි එම ගිවිසුම 2023 වර්ෂය සඳහා ද භාවිතා කිරීමටත් සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ඉන්ධනහල අසල අනවසර ලෙස පවත්වා ගෙන ගිය මාළු වෙළෙඳාම් කිරීමේ ස්ථානය වෙනත් ස්ථානයකට ගෙන ගිය පසු අවසරය ලබා දී ඇති බවත් , වෙනත් මාළු කඩ වලට අවසර දී තිබීම හේතුවෙන් සභාවට ලැබීමට තිබූ ලක්ෂ ගණනක ආදායම නැති වී ඇති බවත් , මෙහි දී ගාස්තු වැඩි කරනවාට වඩා සභාවට ආදායමක් ලබා ගැනීමට ඇති ඒවා පිළිබඳව අවධානයෙන් සිටීම සුදුසු බවත් ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ආර්.ඩී.එක සමඟ සාකච්ඡා කර ටෙන්ඩර් කර තවත් මාළු ලැලි දෙකක්වත් දැමිය යුතු බවත් , පළමුව වාර්ෂික බලපත්‍රයක් ලබා දී ඉන් පසුව ටෙන්ඩර් කර ලබා දීම සුදුසු බවත් , ඒ සඳහා සුදුසු ස්ථානයක් තිබේ නම් දැනුවත් කරන ලෙසත් ය.

**<u>තීරණ අංක 09</u>**

2023 වර්ෂය සඳහා පැල්මඩුල්ල පොදු වෙළෙඳපොළ කඩ කාමර බදු දීම සම්බන්ධ ගිවිසුම ප.පා.කො.1998/03 දරණ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කිරීමටත් , පැල්මඩුල්ල පොදු වෙළෙඳපොළ අංක 14 දරණ මාළු කඩය සඳහා පෙර වර්ෂ වල භාවිතා කළ පරිදි එම ගිවිසුම 2023 වර්ෂය සඳහා ද භාවිතා කිරීමටත් ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර ප්‍රාදේශීය සභා මාර්ග සිතියම් ගත කිරීම පිළිබඳව පැල්මඩුල්ල , කලවාන , නිවිතිගල , කහවත්ත යන ආයතන වල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2022.10.12 දින පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පැවැත්වීමට යෝජිත බවත් , ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරන ලෙසත් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන්

දන්වා එවා ඇත.මෙම එක්දින වැඩමුළුව සඳහා සහභාගී වන නිලධාරීන් 60 දෙනා වෙනුවෙන් සුහසාධන පහසුකම් සඳහා රු.58,800.00 ක මුදලක් වියදම් කිරීමට සිදු වන අතර සමස්ත වියදම ආයතන අතර බෙදා ගත් විට රු.14,700.00 ක මුදලක් අප සභාවට ද දැරීමට සිදු වන නිසා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙම වැඩසටහන වටිනා වුවත් , සභාවල් ද ඉතා අපහසුවෙන් ඉදිරියට ගමන් කරන මෙවැනි අවස්ථාවක සභාවන්ට ලබා දිය යුතු මුදල් ලබා නොදී සභාවෙන් මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු නැති බව ය.

__තීරණ අංක 10__

ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර ප්‍රාදේශීය සභා මාර්ග සිතියම් ගත කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන 2022.10.12 දින පැවැත්වූ අතර මෙම එක්දින වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් 60 දෙනා වෙනුවෙන් සුහසාධන පහසුකම් සඳහා රු.58,800.00 ක මුදලක් වියදම් කිරීමට සිදු වන අතර සමස්ත වියදම ආයතන අතර බෙදා ගත් විට රු.14,700.00 ක මුදලක් අප සභාවෙන් දැරීම සිදු වූ අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**11.** සැලසුම් කමිටු දීමනාව ගෙවීමේ දී ප්‍රාදේශීය සභා සඳහා රු.1,500.00 සිට රු.2,500.00 දක්වා පරාසයක දීමනාව වැඩි කර ගෙවීම පිළිබඳව විරුධත්වයක් නොමැති බවත් , එහි දී ආයතනයට ලැබෙන පෙරසැරි ගාස්තු මුදල නොඉක්මවිය යුතු අතර සැලසුම් කමිටු පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ වලට ද අනුකූල විය යුතු බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇත.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සැලසුම් කමිටු දීමනා ලෙස රු.1,500.00 ක මුදලක් ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ සැලසුම් කමිටුවට සම්බන්ධ වන නිලධාරීන් රාජකාරියේ යෙදී සිටිමින් දෛනික වැටුපක් ලබමින් මීට සම්බන්ධ වන බැවින් ගමන් ගාස්තුවක් තීන්දු කර ලබා දීම සුදුසු බව ය.එය පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සැලසුම් කමිටු දීමනාව ලෙස අතීතයේ සිට ඊට සම්බන්ධ වන එක් නිලධාරියෙකුට රු.750.00 ක අනුමත දීමනාවක් ලබා දුන් බවත් , එය වැඩි කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියෙහි විරුද්ධත්වයක් නොමැති බව දන්වා අති බවත් , මෙහි දක්වා ඇති මුදල් පරාසය තුළ අවම මුදල අප සභාව සුදුසු බවට සඳහන් කර ඇති බවත් ය.

__තීරණ අංක 11__

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සැලසුම් කමිටු දීමනා ලෙස එක් නිලධාරියෙකුට රු.1,500.00 බැගින් ගෙවීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** "දැනුමැති සමාජයක් උදෙසා කියවීම" යන තේමාව පදනම් කර ගනිමින් 2022 වසරේ ද පැල්මඩුල්ල , පාතකඩ හා මාරපන යන පුස්තකාල තුන එක්ව පැවැත්වීමට සංවිධානය කර පහත වැඩසටහන් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

I. පැල්මඩුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහා " ජංගම පුස්තකාල සේවය" ආරම්භ කිරීම.
II. " කතන්දර පැය වැඩසටහන" ශ්‍රී / රත්නාරාම පෙර පාසලේ පැවැත්වීම.
   - නාට්‍ය රංගන ශිල්පියා සඳහා - රු.2,000.00
   - දරුවන්ට චොකලට් ලබා දී සඳහා - රු.3,000.00
III. කියවීම් මාසය වෙනුවෙන් ඔක්තෝම්බර් 17 සිට 31 දින දක්වා පුරා සති දෙකක් නොමිලේ සාමාජිකත්වය ලබා දීම.
IV. පුස්තකාල පිළිබඳව ප්‍රචාරණ වැඩසටහනක් පැවැත්වීම.
V. හොඳම පාඨකයා / ක්‍රියාකාරි පැරණිම පාඨකයා තේරීම. ( ත්‍යාගය සඳහා -රු.4,000.00)
VI. පුස්තකාලයේ ක්‍රියාකාරී පාඨකයින් දෙදෙනෙකු විසින් රචනා කරන ලද පොත් දෙකක් සාහිත්‍ය උත්සවයේ එළිදැක්වීම.
VII. ගෙවතු වගාව සඳහා " බීජ ලබා දීම " පාඨකයින් සඳහා.
VIII. 2019 වසරේ පාඨක තරඟ වල සම්මාන හා සහතික ප්‍රධාන උත්සවය.( සංග්‍රහ සහ අනෙකුත් සැරසිලි සඳහා -රු.50,000.00 )

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

__තීරණ අංක 12__

"දැනුමැති සමාජයක් උදෙසා කියවීම" යන තේමාව පදනම් කර ගනිමින් 2022 වසරේ පැල්මඩුල්ල , පාතකඩ හා මාරපන යන පුස්තකාල තුන එක්ව පැවැත්වීමට සංවිධානය කර ඇති ඉහත වැඩසටහන් සඳහා සභා අනුමැතිය ලබා දීමත් , වියදම් වන මුදල් සභාව මගින් දැරීමත් සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**13.** ප්‍රධාන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන මාර්ග සංවර්ධනය - 2021 (සබරගමු අරුණැල්ල) යටතේ ඉටුකළ ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති දෙකක් සඳහා මුදල් ප්‍රතිපූර්ණය වනතෙක් අවසන් බිල්පත් වටිනාකමින් 80 % ක මුදලක් සභා අරමුදලින් ගෙවීම් කළ අතර එම ගෙවීම් සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

| අනු අංකය | ගෙවීම් කරන ලද ව්‍යාපෘතිය | ගෙවූ මුදල |
|---|---|---|
| 01 | නාරංගොඩ අමුණ මාර්ගය සංවර්ධනය (බිල්පත් වටිනාකම-රු.872,523.78 ) | රු.698,019.02 |
| 02 | මදුරප්පුලිකන්ද කුට්ටපිටිය යා කරන මාර්ගය සංවර්ධනය කිරීම.( බිල්පත් වටිනාකම - රු.267,684.60 ) | රු.214,147.68 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 13**

ප්‍රධාන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන මාර්ග සංවර්ධනය - 2021 (සබරගමු අරුණැල්ල) යටතේ ඉටුකළ ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති දෙකක් සඳහා මුදල් ප්‍රතිපූර්ණය වනතෙක් අවසන් බිල්පත් වටිනාකමින් 80 % ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සම්බන්ධව අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** වැඩ ක්ෂේත්‍ර කම්කරු පී.ඒ.දිල්රුක්ෂි ගුණවංශ මහත්මිය දැනට මාස කිහිපයක සිට ලේකම්තුමාගේ උපදෙස් පරිදි හා ආදායම් පරීක්ෂතුමිගේ අධීක්ෂණය යටතේ ආදායම් රැස් කිරීම සඳහා යොදවා ඇති අතර එම කාලය තුළ ඇය විසින් ආදායම් රැස් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වන ක්ෂේත්‍ර රාජකාරී පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගෙන ඇත.ඇය වෙත ලදුපතක් නිකුත් කර ආදායම් රැස් කිරීම සඳහා ඉලක්ක ලබා දුනහොත් තවදුරටත් ආදායම් රැස් කිරීමේ කටයුතු කාර්යක්ෂමව කර ගැනීමට හැකියාව ලැබීම නිසා ආදායම් පරීක්ෂතුමිගේ අධීක්ෂණය යටතේ ආදායම් රැස් කිරීම සඳහා වැඩ ක්ෂේත්‍ර කම්කරු පී.ඒ.දිල්රුක්ෂි ගුණවංශ මහත්මිය යොදවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 14**

ඉහත යෝජනාව අනුව තවදුරටත් ආදායම් රැස් කිරීමේ කටයුතු කාර්යක්ෂමව කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂතුමිගේ අධීක්ෂණය යටතේ වැඩ ක්ෂේත්‍ර කම්කරු පී.ඒ.දිල්රුක්ෂි ගුණවංශ මහත්මිය යොදවා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකම සභා සම්මත විය.

**15.**පහත නම් සඳහන් සේවකයන්ගේ ගිවිසුම් කාලය මේ වන විට වසරක් සම්පූර්ණ වී ඇති අතර අදාළ දිනයේ සිට එම ගිවිසුම් කාලය ඉදිරියට වසරකින් දීර්ඝ කිරීමට යෝජනා කරමි.

| නම | තනතුර | ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|
| එම්.ඩී.බී.වැලිගමගේ මයා | මුරකරු | 2022.10.20 |
| කේ.ජේ.පී.එම්.ජයතිලක මයා | සෞඛ්‍ය කම්කරු | 2022.10.02 |
| ඕ.වී.ජේ.වික්‍රමසිංහ මයා | ට්‍රැක්ටර් රථ රියදුරු | 2022.10.15 |
| එස්.අයි.අතුකෝරල මයා | වැඩ / ක්ෂේත්‍ර කම්කරු | 2022.12.30 |
| ආර්.විජේවීර මයා | සෞඛ්‍ය කම්කරු | 2022.12.30 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 15**

ඉහත නම් සඳහන් සේවකයන්ගේ ගිවිසුම්ගත සේවා කාලය අදාළ දිනයේ සිට ඉදිරියට වසරකින් දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු අක්කර 03 රූඩ් 01 පර්චස් 62 විශාල පිටියාවත්ත ඉඩමෙහි විශාල පවුල් සංඛ්‍යාවක් ස්ථිර නිවාස තනා ගෙන සිටින අතර තමන් පදිංචි භූමියට නීත්‍යානුකූල ලිපි ලබා දෙන මෙන් එම නිවැසියන් ඉල්ලා සිටිය ද ඉඩම් වල අයිතිය සභාව සතු බැවින් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ.මෙම අනවසර පදිංචිකරුවන් මගින් සභාවට වාර්ෂිකව විශාල බදු ආදායමක් උපයා ගත හැකි බැවින් නීත්‍යානුකූල සංගණනයක් සිදු කර තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා පදනම් කර ගනිමින් වාර්ෂික බදු ක්‍රමයක් හඳුන්වා දීමට මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු මෙම පිටියවත්ත ඉඩමෙහි නිවාස තනා ගෙන සිටින ජනයාට පදිංචිය තහවුරු කර ගැනීමට නොහැකි වීම නිසා දෛනික කටයුතු වල දී , පාසල් වලට දරුවන් ඇතුලත් කිරීමේ දී ඉතා අපහසුතාවයට පත් වන බවත් , මේ සඳහා විකල්පයන් දෙකක් පමණක් ඇති බවත් , එකක් නම් මෙම ඉඩම බැහැර කිරීමට කටයුතු කිරීම බවත් , එය විශාල කාර්යය භාර්යය බවත් , ඒ සඳහා ජනාධිපතුමාගේ අත්සන අවශ්‍ය බවත් , උත්සාහ ගත්ත ද මේ වෙනතුරු එය සිදු වී නොමැති බවත් ය.අනෙක නම් මෙම පදිංචිකරුවන් හඳුනා ගෙන කැඳවා සාකච්ඡාවක් පවත්වා ඉඩම මැනීමක් සිදු කර යම් කිසි සාධාරණ බදු පදනමක් මත එම පදිංචිකරුවන්ට ලබා දීමට කටයුතු කිරීම බවත් , අනාගතයේ දී මේ සඳහා සභාවෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා බවට ලිපියක් ලබා දිය හැකි බවත් , එවිට නීත්‍යානුකූල බැඳීමක් ඇති බවත් , තක්සේරු කර එමගින් සුදුසු ප්‍රතිශතයක් වාර්ෂිකව බදු පදනම යටතේ ලබා ගැනීම සුදුසු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ උත්සාහ කළ ද නිරවුල් කර ගැනීමට නොහැකි වූ නිසා  මෙය තක්සේරු කර සුදුසු ක්‍රමවේදයකට යාම වඩාත් සුදුසු බව ය.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙය සභාවට විශාල ආදායමක් ලබා ගත හැකි ස්ථානයක් බවත් , මෙහි දෙමහල් නිවාසද ඇති බවත් , වඩුආරච්චි මැතිතුමා ද මෙම ඉඩම පදිංචිකරුවන්ට ලබා දීමට කටයුතු සූදානම් කළ බවත් , ඒවා ද මේ සඳහා උපයෝගී කරගෙන සභාපතිතුමා සඳහන් කළ ආකාරයට සුදුසු ක්‍රමවේදයට යාම සුදුසු බවත් , නීත්‍යානුකූල ලියවිල්ලක් ලබා දෙනවාට ජනයා කැමති බවත් , එමගින් දරුවන් පාසලට ඇතුලත් කිරීමේ දී හා බැංකු ණය ලබා ගැනීමේ දී ආදී අවස්ථා වල දී ලැබෙන වාසිය පිළිබඳව ජනයා දැනුවත් කිරීම සුදුසු බවත් , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර ඉඩම ආසන්නයේ සිටින ජනයාට ද මේ ආකාරයට ම ක්‍රමයක් සකස් කළ යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ අනිවාරයෙන් ම එවැනි ක්‍රමවේදයකට යා යුතු බවත් , මැණික් සංස්ථාව , කාර්මික නිලධාරීතුමා , සභාවේ නිලධාරීන් සම්බන්ධ වී ආදාහනාගාර ඉඩමේ පතල් කැනීම සම්බන්ධව ගිය සතියේ සම්පූර්ණ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ බවත් , එක් පතලක අඩි 2ක හා අගල් 10ක දෝනාවක් අප දැනට පිළිගන්නා මායිමෙන් අදාහනාගාර ඉඩම ඇතුලට ඇවිත් ඇති බවත් , එම පුද්ගලයන් ඒ අයගේ මායිම ලෙස පැවසීම නිසා මායිම නිරවුල් නොමැති වීම නිසා පතල නවත්වා ඇති බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ආදාහනාගාර ඉඩම මනින්නේ නැද්ද යන්න ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අධිකරණයෙහි නඩුවක් ඇති බවත් , ඉක්මණින් මැනීමක් අවශ්‍ය බවට අධිකරණයට කරුණු පැවසිය යුතු බවත් , මාසයෙන් මාසයට හෝ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලෙස මැණික් සංස්ථාවට පැවසූ බවත් ය.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ සභාව කසළ බැහැර කරන කෙටේතැන්න ඉඩමෙහිත් ස්ථිර ගෙවල් සාදා ගෙන , ස්ථිර ව්‍යාපාර පවත්වා ගෙන යමින් ජීවත් වන පදංචිකරුවන් සිටින බවත් , ඒ ඉඩම් ද මේ ආකාරයට මැන මේ ආකාරයට කටයුතු කිරීම සුදුසු බවත් , නැතිනම් රාජ්‍ය ආයතන වලට ඉදිරියට ගමන් කිරීමට නොහැකි බවත් , සභාව මඟින් ස්වයං ආදායම් මාර්ග සොයා ගත යුතු බවත් , සභාව සතු ඉඩම් වල අනවසර පදංචිකරුවන් සිටී නම් සුදුසු ම ක්‍රමවේදය නඩු මාර්ගයට යැමට වඩා බදු පදනම මත ලබා දීම බවත් , සතිපොළට පිටුපසින් ඇති කොටසින් ද සභාවට ලැබිය යුතු ආදායම නොලැබෙන බවත් , එම ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත් , මැනුමේදී දෙනවක ගඟ මායිම වන බවත් ය.ඊට අදහස් දක්වමින් ගරු සාභපතිතුමා පවසා සිටියේ තක්සේරු කර ඇති බවත් එම ආදායම් ලබා ගැනීමට කටයුතු සිදු කරන බවත් ය.

**<u>තීරණ අංක 16</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු අක්කර 03 රූඩ් 01 පර්චස් 62 විශාල පිටියාවත්ත ඉඩමෙහි විශාල පවුල් සංඛ්‍යාවක් ස්ථිර නිවාස තනා ගෙන සිටින අතර තමන් පදිංචි භූමියට නීත්‍යානුකූල ලිපි ලබා දෙන මෙන් එම නිවැසියන් ඉල්ලා සිටිය ද ඉඩම් වල අයිතිය සභාව සතු බැවින් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ මුත් මෙම අනවසර පදිංචිකරුවන් මඟින් සභාවට වාර්ෂිකව විශාල බදු ආදායමක් උපයා ගත හැකි බැවින් නිත්‍යානුකූල සංගණනයක් සිදු කර තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා පදනම් කර ගනිමින් වාර්ෂික බදු ක්‍රමයක් හදුන්වා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**17.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා භූමිය තුළ ඉදි කරන ලද වාහන සේවා ස්ථානයේ සේවා කටයුතු සඳහා ඉල්ලුම් කර ඇති පහත ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීමට මහා සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

| අවශ්‍යතාවය | ප්‍රමාණය |
|---|---|
| හයි ප්‍රෙෂර් හෝස් | 15 m |
| එයාර් හෝස් ( කම්ප්‍රෙෂර් හෝස් ) | 15 m |
| ඔයිල් ගන් ( කම්ප්‍රෙෂර් ) | 01 |
| 1L කරඩ 01 , 2L කරඩ | 01 |
| හයිප්‍රෙෂර් ගන්( ගන් එක පමණක් ) | 01 |
| වතුර ටැංකි ( ප්ලාස්ටික් ) | 01 (500L) |
| වාහන සෝදන කෙමිකල් | 25 L |
| වාහන බොඩි වෝෂ් | 10 L |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 17</u>**

කාර්මික නිලධාරීතුමාගේ වාර්තාව ද සලකා බලා , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා භූමිය තුළ ඉදි කරන ලද වාහන සේවා ස්ථානයේ සේවා කටයුතු සඳහා ඉල්ලුම් කර ඇති ඉහත ද්‍රව්‍ය හා උපකරණ මිල දී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**18.**2022.06.09 දින මහා සභාවේ හදිසි යෝජනා යටතේ ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා ඉදිරිපත් කළ 13 වන යෝජනාව වන පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ණය පදනම මත ඉන්ධන ලබා ගැනීම සඳහා රු.ලක්ෂ දෙකක (රු.200,000.00) මුදලක් බලංගොඩ පාර , පැල්මඩුල්ල , සීමාසහිත පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ තැන්පත් කිරීමට අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කළ යෝජනාව හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කිරීම නිසා කල් දී ඇති යෝජනා ලෙස න්‍යාය පත්‍රයට ඇතුලත් කර සභා අනුමැතිය ලබා ගන්නා ලෙස සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් දන්වා එවා ඇත.අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 18</u>**

ඉහත යෝජනාව අනුව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ණය පදනම මත ඉන්ධන ලබා ගැනීම සඳහා රු.ලක්ෂ දෙකක (රු.200,000.00) මුදලක් බලංගොඩ පාර , පැල්මඩුල්ල , සීමාසහිත පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ තැන්පත් කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**19.**සීමාවාසික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රජයේ ආයතන වෙත අනුයුක්ත කිරීමට අදාලව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජ හා කළමනාකාකරණ අධ්‍යන පීඨයේ දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා අධ්‍යානාංශයේ සිව් වන වසරේ ඉගෙනුම ලබන නිමල් මාවත , මොරතොට , ඕපනායක ලිපිනයේ පදිංචි බී.ඒ.යූ.ආර්.කේ.ප්‍රේමරත්න මෙය ( 975301370 v ) යන අයගේ උපාධි පාඨමාලාවට අයත් මාස 06 ක සීමාවාසික පුහුණුව සඳහා 2022.09.01 සිට 2023.03.21 දක්වා අප ආයතයේ කිසිදු ගෙවීමකින් තොරව පුහුණුව නිම කිරීමට කැමැත්ත පල කර ඇත.ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**

සීමාවාසික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රජයේ ආයතන වෙත අනුයුක්ත කිරීමට අදාලව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජ හා කළමනාකාකරණ අධ්‍යන පීඨයේ දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා අධ්‍යානාංශයේ සිව් වන වසරේ ඉගෙනුම ලබන නිමල් මාවත , මොරතොට , ඕපනායක ලිපිනයේ පදිංචි බී.ඒ.යූ.ආර්.කේ.ප්‍රේමරත්න මෙය ( 975301370 v ) යන අයගේ උපාධි පාඨමාලාවට අයත් මාස 06 ක සීමාවාසික පුහුණුව සඳහා 2022.09.01 සිට 2023.03.21 දක්වා අප ආයතයේ කිසිදු ගෙවීමකින් තොරව පුහුණුව ලබා දීමට ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** කහවත්ත ර/ශ්‍රී ක්‍රිෂ්ණා මහ විද්‍යාලය අසල උදෑසන හා දහවල් කාලයේ දී කහවත්ත , පොරෝණුව , වටාපත දක්වා යන මාර්ගයෙහි දැඩි වාහන තදබදයක් ඇති අතර එම හේතුවෙන් සිසුන් මාරුවන මාර්ග සංඥාව හා බස් නැවතුම්පල පෙන්නුම් කරන මාර්ග සංඥාව සවිකර දෙන ලෙස එහි විදුහල්පති එම්.චන්ද්‍රකුමාර මැතිතුමා ඉල්ලා සිටි.ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මෙම මාර්ගය පළාත් මාර්ගයක් වන බැවින් අදාල ආයතන දැනුවත් කිරීමක් සිදු කළ හැකි බව ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙම ස්ථානයෙහි කිහිප වතාවක් ම ළමයි අනතුරට පත් වූ නිසා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කළ බව ය.

**<u>තීරණ අංක 20</u>**
ඉහත යෝජනාව සලකා බලා මෙම මාර්ගය පළාත් සභා මාර්ගයක් වශයෙන් හඳුන්වා දී තිබීම හා පවතින අනතුරුදායක තත්වයට කඩිනමින් විසඳුමක් ලබා දිය යුතු නිසා පැල්මඩුල්ල විධායක ඉංජිනේරු කාර්යාලයට හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු වෙත මේ සම්බන්ධව දැනුම් දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**21.** 2023 වර්ෂයට සැපයුම් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට ආදල සැපයුම් හා සේවා ලැයිස්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 21</u>**
2023 වර්ෂයට සැපයුම් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට ආදල සැපයුම් හා සේවා ලැයිස්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**II. <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** උඩුවන සිට මල්වතු හේන්යාය දක්වා ගම් දෙක යා කිරීම සඳහා උඩුවන පදිංචි යූ.පියසිරි මහතා විසින් ඔහුගේ පෞද්ගලික ඉඩමෙන් මීටර් 300ක පමණ කොටසක් මාර්ගය සාදා ගැනීම සඳහා ලබා දුන් අතර , මීට පෙර ද මාර්ග සංවර්ධන කටයුතු වෙනුවෙන් එතුමන් විශාල දායකත්වයක් මුදලින් හා ඉඩම් වලින් ලබා දී ඇති නිසා එය ඇගයීමක් වශයෙන් උඩුවන සිට මල්වතු හේන්යාය දක්වා ඉදිකර ඇති මාර්ගය "යූ.පියසිරි" මාවත නමින් නම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා පවසා සිටියේ තමන්ගේ වසම බොහෝ දුෂ්කර වසමක් බවත් , ගමනා ගමනයට සුදුසු මාර්ගයක් නොතිබුනු අවධියක යූ.පියසිරි මහතා මාර්ගය සකස් කර ගැනීමට පෞද්ගලික ඉඩමෙන් මීටර් 300ක පමණ කොටසක් ලබා දුන් බවත් , ගරු අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා මාර්ගය කපා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුන් බවත් , මීට පෙර අවස්ථා වල දී ද යූ.පියසිරි මහතා මෙන් ම පවුලේ අය ද මෙවැනි උපකාර කර ඇති බවත් , එතුමා කළ සේවයට අගය කිරීමක් වශයෙන් "යූ.පියසිරි" මාවත නමින් මෙම මාර්ගය නම් කිරීම කළ යුතු බවත් , වත්මනෙහි ජීවත් වන මිනිස්සු තුළ මෙවැනි ගතිගුණ නොමැති බවත් , එක් බිම් අඟලක්වත් දීමට කැමති නැති බවත් එතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා පවසා සිටියේ ඉතා වටිනා යෝජනාවක් බවත් , පෙර මාර්ගයක් නොතිබුන බවත් , යූ.පියසිරි මහතා කළ පරිත්‍යාගය නිසා මෙම මාර්ගය ලැබුනු බවත් , එතුමා මෙන් ම එතුමාගේ පියතුමාත් පක්ෂ භේදයකින් තොරව විශාල සේවයක් කළ පුද්ගලයෙක් බවත් , විදුලිය ලබා දීමේ දී ද එතුමා ගරු වන්නිආරච්චි මැතිතුමා සමඟ එක් වී අවශ්‍ය කටයුතු වලට සහයෝගය දැක්වූ බවත් , එය ප්‍රසංශනීය කරුණක් බවත් , ඊට කළගුණ සැළකීමක් ලෙස මෙම මාර්ගය "යූ.පියසිරි" මාවත නමින් නම් කිරීම සුදුසු බවත් , මෙම යෝජනාව සම්බන්ධව ස්තූති වන බවත් ය.

යූ.පියසිරි මහතාගේ පුද්ගලික ඉඩමෙන් මෙම මාර්ගය සකස් කර ඇති බවත් , කළගුණ සැලකීමක් වශයෙන් මෙය ඉතා වටිනා බවත් , රෝගියෙක් රෝහලකට ගෙනයාමට නොව මෙම මාර්ගයෙහි ගමන් කිරීමටවත් නොහැකි තත්වයක් පැවති බවත් , එමෙන් ම මඩහන්දියෙන් ආරම්භ වූ පසු උඩුහන බන්ට් එකට යන තුරු පොත්තනක්දට හැරෙන මාර්ගය අද වනවිට විනාශ වී ඇති බවත් , ප්‍රිමික්ස් හෝ තාර දමා මාර්ගය සකස් කළ යුතු බවත් , එසේ නොකළහොත් පසුව මෙම මාර්ගයන් සංවර්ධනය කිරීමට විශාල මුදලක් වැය වන බවත් , හැකි ආකාරයෙන් මෙම මාර්ග සංවර්ධනය කරන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසන ලදී.තව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා පෞද්ගලිකව , සාධාරණව පොත්තකන්ද වසමට විශාල ලෙස වැඩ කර ඇති නිසා ගමේ සියලු දෙනාගේම ගෞරවය නිරන්තරයෙන් ලැබෙන බවත් එතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මල්වතුහෙන්යායට යන මාර්ගයෙහි කන්දක් ඇති බවත් , කිසිවෙකුට එමඟින් පහසුවෙන් ගමන් කළ නොහැකි නිසා ලක්ෂ 6ක් යොදවා එම මාර්ගය සකස් කළ බවත් , පියසිරි මුදලාලිලිගෙ ගෙවල් ළඟට මාර්ගය සකස් කිරීමට ගම සමඟ පිළිසඳරක් වැඩසටහනේදී ලක්ෂ 8.50ක් වෙන් කර ඇති බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ යූ.පියසිරි මහතා ඉතා සමාජශීලි පුද්ගලයෙක් බවත් , එතුමාට ස්තුතිවන්ත වන බවත් , එනමින් මාර්ගය නම් කිරීම වැදගත් බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගමේ විරෝධයක් නොමැති නිසා මාර්ගයක් නම් කරන විට අවශ්‍ය නීතිමය වටපිටාව බලා අදාල ආයතන වෙත ලිපි ඉදිරිපත් කරන බව ය.

**<u>තීරණ අංක 22</u>**
උඩුවන සිට මල්වතු හේන්යාය දක්වා ගම් දෙක යා කිරීම සඳහා උඩුවන පදිංචි යූ.පියසිරි මහතා විසින් ඔහුගේ පෞද්ගලික ඉඩමෙන් මීටර් 300ක පමණ කොටසක් මාර්ගය සාදා ගැනීම සඳහා ලබා දීම , මාර්ග සංවර්ධන කටයුතු වෙනුවෙන් එතුමන් විශාල දායකත්වයක් මුදලින් හා ඉඩම් වලින් ලබා දීම ආදිය හේතුවෙන් එය ඇගයීමක් වශයෙන් උඩුවන සිට මල්වතු හේන්යාය දක්වා ඉදිකර ඇති මාර්ගය "යූ.පියසිරි" මාවත නමින් නම් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**III. <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමාගේ යෝජනා.</u>**

**01.**පැල්මඩුල්ල ප්‍රදේශයේ වීදි ආහාර ( Street food ) ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා ඊට අදාල ව්‍යාපෘති සැලැස්ම ගරු සභාවට ඉදිරිපත් කරමින් බදුල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ මෙන් ම කොළඹ ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයෙහි මධ්‍යස්ථානය ලෙස පැල්මඩුල්ල පිහිටා ඇති නිසා මෙම වීදි ආහාර ව්‍යාපෘතිය මඟින් විශාල ලාභයක් ලබා ගත හැකි බවත් , මෙම ගමනාන්තර දෙක මැද මෙවැනි ස්ථානයක් නොමැති බවත් , වෙනත් වීදි ආහාර සාදන ස්ථාන වලින් ආහාරය ගෙන සකස් කළ යුතු බවත් , සංචාරකයන් මෙවැනි දේට වැඩි රුචිකත්වයක් දක්වන බවත් , පැල්මඩුල්ලෙහි ජනයාට ද මෙමඟින් විශාල ආදායමක් පෞද්ගලිකව ගොඩනගා ගත හැකි බවත් , මානසික පීඩනය නැති කරගැනීමට , විවේක කාලය ගත කිරීමට මෙවැනි ස්ථාන වඩා ප්‍රයෝජනවත් වන බවත් , මෙමඟින් පැල්මඩුල්ලෙහි විශාල ව්‍යාපාරික නාමයක් ගොඩනැගිය හැකි බවත් , සංචාරක මධ්‍යස්ථානයක් ලෙස දියුණු වන බවත් , සංචාරකයින් පැල්මඩුල්ලෙහි නතර කරගැනීමට මෙමඟින් අවස්ථාව උදා වන බවත් , මෙමඟින් ඍජු ලෙසත් වක්‍ර ලෙසත් පැල්මඩුල්ලට විශාල ආදායමක් ලැබෙන බවත් , රැකියා දස ලක්ෂයේ සේවකයින් බොහොමයක් සිටින නිසා ඔවුන්ව මේ සඳහා යොදවා ගත හැකි බවත් , එමඟින් ඔවුන්ගේ ශ්‍රමය අපතේ නොයන බවත් , සභාව පිළිබඳව ජනයා අතර ඇති ආකල්පය වැඩි දියුණු කළ හැකි බවත් , ලැබෙන ආදායමෙන් පැල්මඩුල්ලෙහි විශාල සංවර්ධනයක් සිදු කළ හැකි බවත් , සංගීතය මෙන් ම විනෝද ක්‍රීඩා ද මීට සම්බන්ධ කර ගත හැකි බවත් , ඉතා අඩු මුදලකට මෙය මුලින් ම ආරම්භ කළ හැකි වුවත් ආර්ථික වශයෙන් විශාල ලාභයක් ලබා ගත හැකි බවත් , මෙය සභාව මඟින් ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන ගිය යුතු බවත් , දෙසැම්බර් මාසයේ ආරම්භ කළහොත් වඩා ඵලදායි කර ගත හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ වීදි ආහාර පිළිබඳව යෝජනාව වටිනා බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා ඉදිරිපත් කළ සංවිධාන ව්‍යුහය සුදුසු බවත් , තව ද දේශීය නර්තන ආදිය ඇතුලත් කර ගත හැකි නම් තවත් ඵලදායි කර ගත හැකි බවත් , නගරය ආශ්‍රිතව සිදු කිරීම සුදුසු බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ සංචාරකයින් පැමිණීමේ දී ඔවුන්ව පැල්මඩුල්ලෙහි නතර කර ගැනීමට මෙය ඉතා වටිනා බවත් , නුවර ගිය විට එහි උඩරට නැටුම් ආදිය මඟින් ජනයා ආකර්ෂණය කර ගන්නා මෙන් අපේ සංස්කෘතියට අදාල දේවල් ද මෙහි දී නැරඹීමට සැලැස්විය හැකි බවත් , මේ සඳහා ඉඩකඩ ඇති භූමියක් පවතින්නේ නම් වටිනා බවත් , මෙමඟින් ලොකු දියුණුවක් අප ප්‍රදේශයට ලබා ගත හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටියේ මෙම යෝජනාව ඉතා වටිනා බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම වෙලාවෙහි සභාවට විශාල ඉඩකඩ ප්‍රමාණයක් නොමැති නිසා සුළුව ආරම්භ කර බැලීම සුදුසු බව ය.මෙම ව්‍යාපෘති සැලැස්ම බලා ස්ථානයක් තෝරා ගත යුතු බවත් , විශාල මුදලක් වියදම් නොකර මේවාට කැමති ජනයා සම්බන්ධ කර ගනිමින් අදහසක් ගත යුතු බවත් , නගරයේ සිදු කළ හැකි නම් වටිනා බවත් , සතිපොළ අසල රථ ගාලෙහි ටෙලිකොම් ආයතනය අසල ඇති ඉඩම මේ සඳහා යොදා ගත හැකි නම් ඵලදායි බවත් , දිනපතා අපිට මෙමඟින් විශාල ආදායමක් ලබා ගත හැකි බවත් , පෙනුම ආකර්ෂණීය ලෙස සකස් කළ යුතු බවත් , මේ සඳහා වියදමක් දැරීමට බලාපොරොත්තු නොවන බවත් , සම්පත් දායකයන් සම්බන්ධ කර ගෙන ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් , මේ හා සම්බන්ධ වීමට කැමැත්තක් දක්වන අය සිටිනවා නම් සම්බන්ධව වන ලෙස සමාජ මාධ්‍යයේ ප්‍රචාරය කිරීම සුදුසු බවත් , මෙම කාර්යය සාර්ථක කර ගැනීමට උත්සාහ කරමු යන්නත් තව දුරටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 23</u>**
පැල්මඩුල්ල ප්‍රදේශයේ වීදි ආහාර ( Street food ) ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ඉදිරිපත් වූ යෝජනාවෙහි පළමු අදියර වශයෙන් කාර්මික නිලධාරීතුමා විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර , ඇස්තමේන්තු සකස් කර එම ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.**පැල්මඩුල්ල ප්‍රදේශයේ හෙල බොජුන් හලක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය පවසා සිටියේ කෙටේතැන්න ඉඩම හෝ සතිපොළ රථ ගාල අසල ඉඩමෙහි හෙළ බොජුන් හලක් ආරම්භ කිරීම සුදුසු බවත් , වැලිගෙපොළ ප්‍රාදේශීය සභාව මඟින් පවත්වා ගෙන යන හෙල බොජුන් හලෙන් ලැබෙන ආදායමෙන් 5%ක් පමණක් ප්‍රාදේශීය සභාවට ලබා ගන්නා බවත් , ඉතිරිය වෙළෙඳුන් සඳහා ගෙවන බවත් , එහි සෑම ආහාරයක් ම හාල් පිටි වලින් සාදන බවත් , එමඟින් වෙළෙන්දන් දිනකට විශාල ආදායමක් ලබා ගන්නා බවත් , ගම්වලින් දේශීය ආහාර සාදන පුද්ගලයන් සොයා ගත හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය පවසා සිටියේ වීදි ආහාර සාදන ස්ථානයේ ම හෙල බොජුන්හලක් සකස් කළ හැකි නම් වඩාත් සුදුසු බව ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ හෙල බොජුන් හලක් ආරම්භ කිරීමට විශාල මුදලක් වැය වන බවත් , එය ආරම්භ කිරීමට උත්සාහ ගනිමු යන්නත් , වැලිගෙපොළ ප්‍රාදේශීය සභාව මඟින් ආරම්භ කර ඇති හෙළ බොජුන් හල සඳහා ද විශාල මුදලක් වැය වී ඇති බවත් ය.

**<u>තීරණ අංක 24</u>**
මේ වන විට මෙවැනි විශාල වැය බරක් දරා ව්‍යාපෘතියක් නිම කිරීමට ප්‍රමාණවත් මුදලක් සභා අරමුදල තුල නොමැති බැවින් ද පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම සීමා කර ඇති බැවින් ද එම අර්බුදකාරී තත්වයන් සමනය වූ පසු රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකින් මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගෙන මෙම ව්‍යාපෘතිය දියත් කිරීම කාලෝචිත බවට ඒකමතිකව සභා සම්මත විය.

**හදිසි යෝජනා.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** ගරු ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා ලෙස කටයුතු කරන මා 2022.10.23 වන දින සිට 2023.01.23 වන දින දක්වා විදෙස් ගත වීමට බලාපොරොත්තු වන බැවින් නිවාඩු අනුමත කර දෙන ලෙසත් , ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙය පෞද්ගලික ගමනක් මිසක් රාජකාරී ගමනක් නොවන බව ගරු උප සභාපති ඩී.ඩී.උපාලි මැතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 25</u>**

ගරු ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා ලෙස කටයුතු කරන ගරු ඩී.වී.උපාලි මැතිතුමාට 2022.10.23 වන දින සිට 2023.01.23 වන දින දක්වා විදෙස් නිවාඩු අනුමත කිරීමත් , ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමත් සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක වාර්ථා සලකා බැලීම - 2022-09-08 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-09-08 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-09-01 සිට 2022-09-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා 2023 අයවැය කෙටුම්පත සලකා බැලීම.**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ කසළ බදු හිඟය ලක්ෂ ගාණනක් පැවතිය ද රු.2000.00 ක් පමණ මෙම මාස ගණනටම අරගෙන ඇති බවත් , නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කර නැද්ද යන්නත් , සභාවට එන ආදායම් නිශ්චිතව අය කර ගත යුතු බවත් ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කසළ බදු හිඟ මුදල් අය කර ඇති බවත් , එහිදී හිඟ මුදල් ලෙස ලදුපත් වල සඳහන් කර නොමැති නිසා ආදායම් ප්‍රගති වාර්තාව සකස් කිරීමේ දී ප්‍රවර්ථන වාර්ෂයට අදාලව සඳහන් කර ඇති බවත් ඊළඟ ආදායම් ප්‍රගති වාර්තාව සකස් කිරීමේ දී එය නිවැරදිව සඳහන් කරන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ අනුව 2022-09-01 සිට 2022-09-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>2023 අයවැය කෙටුම්පත සලකා බැලීම.</u>**

2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත සලකා බලන ලෙසත් , මූලික සාකච්ඡාවේ දී කතා කළ කරුණු අනුව අයවැය කෙටුම්පත සකස් කර ඇති බවත් , සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් , ගිය වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයේ සත්‍ය ආදයමට ගැලපෙන ලෙස කෙටුම්පත සකස් කර ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමා විමසා සිටියේ වෙනත් ආදායම් යටතේ කොම්පෝස්ට් පොහෙර අලෙවිය සඳහා අඩුවෙන් මුදල් වෙන් කර ඇත්තේ ඇයි ද යන්නය.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පොහොර අලෙවිය අඩුවක් පවතින බවත් , පොහොර රටින් නොගෙන ආ කාලයේ අප සභාවේ කොම්පෝස්ට් පොහොර බොහෝ දෙනා මිල දී ගත් බවත් නමුත් එය දැන් අඩු වී ඇති බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ රටේ පවතින ආර්ථික රටා වල වැරදි ක්‍රියා මෙමඟින් පෙන්නුම් කරන බවත් , දූෂණ වංචා හේතු කොටගෙන රට පහතට වැටී ඇති බවත් , ඒවායෙහි බලපෑම ප්‍රාදේශීය සභාවල් වලට ද පැනනැගී ඇති බවත් , මහජන උපයෝගිතා හා සුභ සාධන වියදම් වලට ද මෙම පවතින තත්ත්වය අනුව මුදලක් වෙන් කර ගැනීමට නොහැකිව තිබෙන බවත් ය.තව ද තමන් ව්‍යාපෘති දෙකක් සිදු කළ බවත් එහි දී ජනතාවගෙන් ම ශ්‍රමය ලබා ගත් බවත් , එවිට මුදල් සකසුරුවම් කර පරිහරණය කළ හැකි බවත් , ඒ ආකාරයට කටයුතු කළහොත් යම් කිසි මුදලක් ඉතුරු කර ගත හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ආණ්ඩුකාරතුමා සමඟ හා විෂය භාර අමාත්‍ය ජානක වක්කුඹර මැතිතුමා සමඟ සියලු සභාපතිතුවරුන් මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත් , එහි දී පළාත් සභාවෙන් මිලියන 10ක් හා අමාත්‍යාංශයෙන් මිලියන 10ක් ලෙස මිලියන 20 ක් ලබා දීමට කැමැත්ත පළ කර බවත් , එය අයවැයට ඇතුලත් කරන ලෙස පැවසූ බවත් , පෙර පරිදි උපකල්පනය කර පමණක් ඇතුලත් කර ඵලදායි නොවන බවත් ය.තව ද සාදා තිබෙන මාර්ග ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු බවත් , මාර්ග නඩත්තුව ආරම්භ කළ යුතු බවත් , නැතිනම් කිසිවෙකුට ගමන් කළ නොහැකි තත්වයක් උදා වන බවත් , පළාත් සභාවෙන් , පාර්ලිමේන්තුවෙන් කොපමණ මුදලක් වෙන් කරයිද යන්න නිශ්චිතව සඳහන් කළ නොහැකි බවත් , ප්‍රිමික්ස් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ලබන සභාවට ඇස්තමේන්තුවක් සමඟ යෝජනාවක් ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ප්‍රිමික්ස් වලට වෙන් කර නොමැති බවටත් , සභාවේ දේපල වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා නඩු වලින් නිදහස් කර ගැනීමට යම්කිසි මුදලක් වෙන් කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදී.සංශෝධනයක් සිදු කර හෝ ප්‍රිමික්ස් ව්‍යාපෘතියට කොටසක් වෙන් කළ යුතු බවත් , අධිකරණයෙහි පවතින නඩු වලින් නිදහස් විය යුතු බවටත් ,ඒ සඳහා මුදල් වෙන් කර ඇති බවටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**08.** **වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

**කිරිඳි ඇල්ල සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති සැලැස්ම පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම.**

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ පෞද්ගලික ආරක්ෂකයන් යෙදවීම ලෙස සටහන් වී ඇති බවත් එහි දී සභාවෙන් සම්මුඛ පරීක්ෂණයක් සිදු කර සුදුසුකම් ඇති අය ආරක්ෂකයන් ලෙස බඳවා ගෙන පත්වීම් ලබා දීම සුදුසු බවත් , එම පුද්ගලයින්ට වැටුප් යකුපිටි සමන් ප්‍රියදර්ශන මහතා විසින් ගෙවීම සුදුසු බවත් ය.සභාපතිතුමා විසින් අදහස් ඉදිරිපත් කරමින් පවසා සිටියේ මුදල් එකතු කිරීමට සභාවේ පුද්ගලයෙකු ද යෙදවිය යුතු බව ය.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ඉදිරිපත් කළ අදහසට තමා එකඟ වන බවත් , අවසර පත්‍රයක ගාස්තුව සභාව මඟින් තීරණය කර සභාවෙන් ප්‍රින්ට් කර නිකුත් කළ යුතු බවත් , එම ස්ථානයේ දී කිසිවෙකුට හෝ හදිසි රෝගී තත්වයක් ඇති වුවහොත් ප්‍රථමාධාර ලබා දීමට හැකි විය යුතු බවත් , රථ ගාල් වලින් හා රථ වාහන වලින් ලබා ගන්නා මුදල් සභාව සතු විය යුතු බවත් ය.ජංගම වෙළෙඳකුටි සාදනවානම් ඒවා සභාව සතු විය යුතු අතර සභාවට බලය තිබිය යුතු බවත් , මෙම ව්‍යාපෘති සැලැස්මෙහි ඒවා සංශෝධනය විය යුතු බවත් , ප්‍රසිද්ධ නීතිඥයෙකු ළඟ ගිවිසුම අත්සන් කළ යුතු බවත් ය.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අදාල කොන්දේසි කඩ කළහොත් ගිවිසුම අවලංගු වන ආකාරයට ගිවිසුම සකස් කළ යුතු බව ය.අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙහි අධීක්ෂණය සඳහා ලේකම්තුමා ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු යොදවන බවත් , යම් අවස්ථාවක කොන්දේසි කඩ කළහොත් එම අවස්ථාවේ දී ම ගිවිසුම අවලංගු වන ආකාරයට ගිවිසුම සකස් කරන බවත් , ගිවිසුම සකසා සභාවට ඉදිරිපත් කරන බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ හදන මේ සම්බන්ධව කමිටුවක් සකස් කළ යුතු බවත් , එයට ගරු මන්ත්‍රීවරු කිහිපදෙනෙකු ද ඇතුලත් කළ යුතු බවත් , කිරිඳි ඇල්ල ආශ්‍රිතව රජය මඟින් යම්කිසි ව්‍යාපෘතියක් සිදු වේ නම් එවැනි අවස්ථාවක දී ඊට අනුගත විය හැකි ආකාරයට ගිවිසුම සකස් විය යුතු බවත් ය. අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කිරිඳි ඇල්ල සංවර්ධනය කිරීමට ප්‍රාදේශීය සභාව හෝ රජය මඟින් තීරණය කළහොත් එවිට එම ආයෝජකයා එකඟ වන බවට ගිවිසුම කසක් කරන බව ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා එහි ඉදිකිරීම් සම්බන්ධව විමසන ලදී.අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පඩිපෙළෙහි , වැසිකිළි වල ඉදිකිරීම් සිදු කරන බවත් , එම සෑම ඉදිකිරීමක් ම කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය සභාවේ අනුමැතියට යටත්ව ඉදි කළ යුතු බව ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙය පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව සිදු වන්නක් ද බව ය.අනිවාරයෙන් ම අනුමැතිය ලබා ගත යුතු බවත් , ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනුමැතිය ද ලබා ගත යුතු බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා.**

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ අප ප්‍රදේශයේ කෝටි ගණන් වියදම් කර කාපට් පාරවල් සෑදූ බවත් , නමුදු ඒවායෙහි කොළරය සකස් නොකිරීම නිසා කඩා ගෙන යන බවත් , එනිසා ඉහළ බෝපිටිය පාරවල් වල දෙපැත්තම සේදී යන බවත් , තව දවස් කිහිපයකින් එම මාර්ග වල ගමන් කළ නොහැකි වන බවත් ය.අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව කිහිප වතාවක්ම ඉහල නිලධාරීන් සමඟ සාකච්ඡා කළ බවත් , මුදලක් වෙන් කර නොමැති බවට මාර්ග සංවර්ධන අධිකාරිය පවසන බවත් , අපේ මාර්ග භාර ගන්නා ලෙස ඔවුන් සඳහන් කරන බවත් , එනිසා කාර්මික නිලධාරිතුමාට පවතින අඩුපාඩු ලකුණු කර භාර ගන්නා ලෙස පැවසූ බවත් , නැතිනම් ජල සම්පත් මණ්ඩලයෙන් ජල බටයක් දමා ගැනීමට පැමිණීමෙදිත් ගැටළු මතු වන බවත් , මාර්ග භාර ගෙන හැකි පරිදි කටයුතු සිදු කිරීමට සිදු වන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.**

අදහස් දක්වමින් එතුමා පවසා සිටියේ ඔක්තෝම්බර් මස 24 වන නිවාඩු දිනයේ ගම්වාසීන් එකතු වී සිංහපුර මාර්ගය කොන්ක්‍රීට් කරන බවත් , ඒ සඳහා හැකි පමණ ආධාරයක් ලබා දෙන ලෙසත් ය.තව ද පහුගිය දිනක බත් දන්සලක් දුන් බවත් සභාවෙන් ලබා දිය හැකි උපකාර ලබා දුන් බවත් , ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමා , ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටම ස්තූත්වන්ත වන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා.**

පසුගිය දිනවල පැවති වර්ෂාව සමඟ 2022-10-02 වන දින බැරණ්ඩුව කොට්ඨාසයේ උඩදලුව වතු නිවාස ආසන්නයේ තිබූ ඉතා විශාල කොට්ට ගසක් ලෙල්ලොපිටිය - හෙට්ටිකන්ද මාර්ගය හරහා කඩා ගෙන වැටුනු බවත් , එම මාර්ගය විධායක ඉන්ජිනේරු කාර්යාලයට අයත් මාර්ගයක් බවත් , අදාල ආයතනය දැනුවත් කළ ද මුදල් ප්‍රතිපාදන නොමැති බව සඳහන් කළ බවත් , වාහන ගමනාගමනයට අපහසු බැවින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා හා ප්‍රදේශවාසීන් එක්ව ගස කපා ඉවත් කිරීමට කටයුතු කළ බවත් , නමුදු මාර්ගය දෙපස එම ගස දැනට ද පවතින බවත් , මේ සම්බන්ධව ගොඩගම විධායක ඉන්ජිනේරුතුමාව දැනුවත් කරන ලෙසත් , ඒ සඳහා සහය වූ අය සඳහා යම් කිසි උපකාරයක් කිරීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැතිතුමා බී.ඒ.ඉන්දික අදහස් දක්වමින් පවසා සිටියේ ගස ඉවත් කිරීමට වත්තෙන් උවමනාවක් නොකර මඟහැරිය බවත් , වතු අධිකාරීතුමාව දැනුවත් කරන ලෙසත් , මෙමඟින් විදුලි කණු 3 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කැඩී ඇති බවත් , ගස ඉවත් කිරීමට කටයුතු කළ පිරිසට යම්කිසි මුදලක් වත්තෙන් ගෙවූ බවත් ය.

තවමත් එම ගස මාර්ගය දෙපස ඇති බවත් , ඒ සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාල ආයතන දැනුවත් කිරීමට කටයුතු කළ බවත් , ඒ සඳහා සහය වූ අය සඳහා යම් කිසි මුදලක් වත්තෙන් ගෙවා ඇති බවත් , විගණනයේ දී ගැටළුවක් ඇති විය හැකි නිසා සභාවෙන් මේ සඳහා ගෙවීමක් කළ නොහැකි බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා.**

වර්තමාන තත්ත්වය හමුවේ රට මුහුණු දී සිටින ආර්ථික හා ආහාර අර්බුදයට පිළියමක් සෙවීමට පැල්මඩුල්ල ජනතාවට සහයෝගයක් වීමට සැලසුම් සකස් කිරීමට යෝජනා කරන බවත් , එහි දී අපේ පනතෙහි මෙය කළ හැකි බවට සඳහන් වන බවත් , සමන් උපසේන මැතිතුමා කුඹුරු අස්වද්දන්නට සූදානම් වන බවත් , ප්‍රාදේශීය සභාවක් ලෙස අපිටත් යම් කිසි දෙයක් කළ හැකි නම් වටිනා බවත් , මිරිස් පැළයක් ද රු.150.00ක් පමණ වන බැවින් වගා කිරීමට උත්සාහ දරන අයට උදව්වක් කළ හැකි නම් හොඳ බවත් , කොම්පෝස්ට් පොහොර ලබා දිය හැකි බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සඳහා ආණ්ඩුවෙන් පොදු ව්‍යාපෘතියක් ඇති බවත් , ගම් වල සිටින ක්ෂේත්‍ර නිලධාරීන්ට නිවාස බෙදා දී යම් කිසි වැඩ පිළිවෙලක් මේ දින වල සිදු වන බවත් , ඒ සඳහා ගමේ මන්ත්‍රීවරයාට සම්බන්ධ වී කටයුතු කළ හැකි බවත් , සභාවක් ලෙසට ඒ සඳහා පොහොර ආදිය ලබා දීමට හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ නිලධාරීන් සමඟ වැඩ කටයුතු කිරීමේ දී අවධානයෙන් සිටිය යුතු බවත් , අධීක්ෂණයක් අනිවාරයෙන් ම තිබිය යුතු බවත් , පවතින තත්වය සමඟ අනාගතයේ දී ජීවත් වීමට අපහසු තත්වයක් උදා වන බවත් , සභාවක් ලෙස මීට සහයෝගය ලබා දිය හැකි නම් වටිනා බවත් ය.

බෝපැත්ත ප්‍රධාන මාර්ගයෙහි නඩත්තු කිරීම සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා විමසා සිටින ලදී.ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ බෝපැත්ත ප්‍රධාන මාර්ගයෙහි නඩත්තු කිරීම විධායක ඉන්ජිනේරුතුමා ආරම්භ කර ඇති බවත් , ඊට පසුව පොරෝණුව , මදුරප්පුලිකන්ද මාර්ග වල නඩත්තු කිරීම් ද සිදු කරයි යන්න ය.පාළුගම්පල මාර්ගය , මදුරප්පුලිකන්ද මාර්ගය පිළිබඳව ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කළ බවත් , ඒවා සම්බන්ධව ඉහළට යොමු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා සිටි බවත් , පළාත් මාර්ග නඩත්තුව ආරම්භ කර ඇති බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා පවසා සිටියේ පොත්තකන්ද පාර ද නඩත්තු කළ යුතු බව ය.ඒ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාව දැනුවත් කරන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා බෝපැත්ත පිට්ටනිය සම්බන්ධව විමසන ලදී.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ තොරතුරක් නොලැබුනු බවත් , ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් විමසිය යුතු බවත් ය.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ හකමුව ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමසුවාද යන්නත් , ඉහල හකමුවත් පහළ හකමුවත් අතර කොටසක තිබෙන පතල සම්බන්ධව සබරගමුව පළාත් ජ්‍යෙෂ්ට නියෝජ්‍ය පොලිස්පතිතුමාට ලිපියක් යොමු කරා ද යන්න ය.අදහස් දක්වමින් ගරු සභපතිතුමා පවසා සිටියේ සබරගමුව පළාත් ජ්‍යෙෂ්ට නියෝජ්‍ය පොලිස්පතිතුමාට එදිනම ලිපිය යොමු කළ බවත් ගරු මන්ත්‍රීතුමාට අදාල පිටපත අද සභාවෙන් ලබා ගත හැකි බවත් , හකමුව ජල ව්‍යාපෘතිය පිළිබඳව අදාල ආයතනය සමඟ කතා කර නිශ්චිත පිළිතුරක් ලබා දෙන බවත් ය.ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා පවසා සිටියේ මෙම ජල ව්‍යාපෘතියෙහි පැවති යම් කිසි දූෂණ හේතුවෙන් එය නතර වී ඇති බවත් , ඉදිරියට කඩිනමින් එය කරගෙන යා යුතු බවත් ය.යම්කිසි දූෂණයක් සිදු වී ඇති නම් සඳහන් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසන ලදී.

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමියහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 නොවැම්බර් මස 10 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපති තුමන්, විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

ප.ව.12.00 පමණ සභාවේ කටයුතු අවසන් විය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022-11-01 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

ප්‍රාදේශීය සභා .................................................................. මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා .............................................................................. මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-11-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව